හම්බන්තොට මහා නගර සභාව - 2024

----

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

හම්බන්තොට මහා නගර සභාවේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන මහා නගර සභා ආඥා පනතේ (252 අධිකාරය) 219 වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 (1) උපවගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2024 දෙසැම්බර් 31 දිනට හම්බන්තොට මහා නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විසින් විගණනය සිදු කරන ලදී. මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මහා නගර සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව මහා නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇති වීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදු වන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදු වන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන්, අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසා බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මහා නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව,

- අදාළ ලිඛිත නීතියකට හෝ මහා නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මහා නගර සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මහා නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

	විගණන නිරීක්ෂණ	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	මහා නගර සභාව වෙත සමාලෝචිත වර්ෂයට අදාලව ලැබිය යුතු මුද්දර ගාස්තු ආදායම් ගිණුම් වලින් අත්හැරී තිබුණු අතර ජනවාරි සිට ජුනි දක්වා කාලයට පමණක් අදාලව ලැබිය යුතු බවට ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් තහවුරු කරන ලද ආදායම රු.මිලියන 2.48 ක් වී තිබුණි.	2025 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව.	ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ තහවුරු කරන ලද ආදායම් ගිණුම්ගත කළ යුතුය.
(ආ)	2015 වර්ෂයේදී, මහා නගර සභාවට අයත් රුහුණු ප්ලාසා ගොඩනැගිල්ලේ පළමු මහල බදුගත් බදුකරු විසින් රු.මිලියන 11.67 ක වියදමක් දරා නවීකරණය කර තිබීම නිසා බදුකරු ගෙවිය යුතු මාසික බදුකුලියෙන් සියයට 50 ක්, දරන ලද එම වියදම් වලට හිලව් කිරීමටත්, ඉතිරි කුලිය නගර සභාව වෙත මුදලින් ගෙවීමටත් එකඟතාවය ඇති කර ගෙන තිබුණි. කෙසේ නමුත් මෙයින් ගිණුම්ගතවී තිබුණේ බදුකරු මුදලින් ගෙවනු ලැබූ කුලිය පමණක් වීමෙන් මහා නගර සභාව වෙනුවෙන් බදුකරු දරන ලද ප්‍රාග්ධන වියදම්ද, වර්ෂය අවසානය වන විට රු.මිලියන 3.09 ක (හිලව් කල සියයට 50)කුලී ආදායම්ද, රු.මිලියන 8.57 ක් වූ හිලව් කිරීමෙන් ඉතිරි වූ ශේෂය කලින් ලද ආදායම් යටතේද ගිණුම්ගත කර නොතිබුණි.	2025 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව.	මෙම ගොඩනැගිල්ල කුලියට දීම සම්බන්ධයෙන් ඇති වූ සියලු මූල්‍ය ගනුදෙණු නිවැරදිව ගිණුම්ගත කළ යුතුය.
(ඇ)	සමාලෝචිත වර්ෂයට අදාලව, එකතුව රු.325,501 ක් වූ වියදම් වෙනුවෙන් ණයහිමියන් ඇතිකර නොතිබුණි.	2025 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව.	දෙසැම්බර් 31 දිනට ණයහිමියන් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය.

(ඈ)	මහා නගර සභාව වෙත 2021 දෙසැම්බර් 20 දින ලැබී තිබුණු රු.925,000 ක වටිනාකම සහිත කාය වර්ධන උපකරණ ප්‍රාග්ධනිත කර නොතිබුණි.	2025 වර්ෂයේ ජර්නල් සටහන් මඟින් නිවැරදි කළ බව.	සභාව වෙත ලද උපකරණ ප්‍රාග්ධනිත කළ යුතුය.

1.7 නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

	නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව	අනුකූල නොවීම	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 571	වසර 02 ඉක්ම වූ රු.457,948 ක් වූ මිශ්‍ර තැන්පතු ශේෂ 101 ක් ආදායමට ගැනීමට කටයුතු කර නොතිබුණි.	සභා ආදායමට ගැනීමට ඉදිරි ක්‍රියාමාර්ග කඩිනමින් සිදු කරන බව.	වසර 02 ඉක්ම වූ තැන්පත් ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි සංග්‍රහයේ යොමුගත රෙගුලාසිය ප්‍රකාරව කටයුතු කළ යුතුය.
(ආ)	2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 02 (i)	සභාවේ සේවයේ නියුතු සමස්ථ කාර්ය මණ්ඩලය 173 ක් වූ අතර ඉන් 10 දෙනෙකුගේ පමණක් ඇඟිලි සලකුණු යන්ත්‍රය මඟින් පැමිණීම හා පිටවීම සනාථ කිරීම් වාර්තා තබාගෙන තිබුණද, 163 දෙනෙකුගේ වාර්තා එසේ තබාගෙන නොතිබුණි.	කඩදාසි සඳහා යන වියදම අවම කිරීමේ අරමුණින් සහ යම් අවස්ථාවලදී මෙම යන්ත්‍රය ඇඟිලි සලකුණ ලබා නොගත් බව සහ නව යන්ත්‍රය මඟින් මුද්‍රිත පිටපත් ලබාගෙන ගොනුගත කරන බව.	ඇඟිලි සලකුණු යන්ත්‍රය මඟින් පැමිණීම හා පිටවීම වාර්තා තබා ගැනීම සම්බන්ධයෙන් යොමුගත චක්‍රලේඛයට අනුකූලව කටයුතු කළ යුතුය.
(ඇ)	2019 ජූනි 27 දිනැති භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ අංක 05/2019 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 03 ඡේදය	සභාවේ සේවය හැරගිය හා මියගිය සේවකයින් 19 දෙනෙකුගෙන් ලැබිය යුතු රු.92,225 ක් වූ ණය ශේෂ අයකරගෙන නොතිබුණි.	2025 මැයි මස සිට ඇපකරුවන්ගෙන් අයකිරීමට කටයුතු කරන බව.	ණය ශේෂ අයකිරීම සම්බන්ධයෙන් යොමුගත චක්‍රලේඛයට අනුකූලව කටයුතු කළ යුතුය.

(ඇ)	2010 දෙසැම්බර් 27 දිනැති අංක දපපා/පපාකො/ 2010/01 දරණ දකුණු පළාත්, පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛය			
	i. 05 ඡේදය	සෑම ගිවිසුමක්ම වසර 03 කට වරක් යාවත්කාලීන කළ යුතු වුවත්, තිස්ස පාර කඩ කාමර දෙකක සහ ස.තො.ස. ගොඩනැගිල්ලේ ඒ ආකාරයට ගිවිසුම් යාවත්කාලීන කිරීමට කටයුතු කර නොතිබුණි.	ගිවිසුම් 02 ක් සඳහා ලිඛිතව දන්වා ඇති බව සහ ස.තො.ස ගොඩනැගිල්ල සඳහා ආණ්ඩුකාර අනුමැතිය ලැබුණු පසු ගිවිසුම්ගත වන බව.	චක්‍රලේඛය ප්‍රකාරව ගිවිසුම වසර 03 කට වරක් යාවත්කාලීන කළ යුතුය.
	ii. 06 ඡේදය	බදු දුන් දේපල වසර 5 කට වරක් තක්සේරු කළ යුතු වුවත්, කඩ කාමර 8 ක් සම්බන්ධයෙන් එපරිදි කටයුතු කර නොතිබුණි.	තක්සේරුව සඳහා අත්තිකාරම් මුදල් ගෙවා ඇති බව සහ තක්සේරුව ලද වහාම එපරිදි කටයුතු කරන බව.	චක්‍රලේඛය ප්‍රකාරව බදු දුන් දේපල වසර 5 කට වරක් තක්සේරු කළ යුතුය.
(ඉ)	2018 මාර්තු 19 දිනැති අංක 01/2018 දරන භාණ්ඩාගාර ලේකම්ගේ වත්කම් කළමනාකරණ චක්‍රලේඛය	ධාවනයෙන් ඉවත් කර තිබූ කැබ් රථය අපහරණය කිරීමට හෝ අලුත්වැඩියා කර භාවිතයට ගැනීමට කටයුතු කර නොතිබුණි.	ඉවත් කිරීම සඳහා යාන්ත්‍රික ඉංජිනේරු නිර්දේශය ලැබී ඇති බව සහ ඉවත් කිරීමට අනුමැතිය ඉල්ලා ඇතත් එකඟතාවය ලැබී නොමැති බව.	ධාවනයෙන් ඉවත් කරන ලද වාහන අපහරණය කිරීමට හෝ අලුත්වැඩියා කිරීමට කටයුතු කළ යුතුය.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.මිලියන 8.08 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.මිලියන 30.53 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

නාගරික කොමසාරිස්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

	2024				2023			
ආදායම් ප්‍රභවය	**ඇස්තමේන්තුගත ආදායම**	**බිල් කළ ආදායම**	**රැස් කළ ආදායම**	**දෙසැම්බර් 31 දිනට මුළු හිඟය**	**ඇස්තමේන්තුගත ආදායම**	**බිල් කළ ආදායම**	**රැස් කළ ආදායම**	**දෙසැම්බර් 31 දිනට මුළු හිඟය**
	රු.	**රු.**	**රු.**	**රු.**	**රු.**	**රු.**	**රු.**	**රු.**
වරිපනම් හා බදු	14,021,900	13,974,788	11,489,862	2,484,927	13,937,000	13,939,528	14,205,275	6,415,325
කුලී	44,281,300	50,139,249	47,240,599	2,898,650	41,795,000	45,058,599	40,905,201	7,043,538
බලපත්‍ර ගාස්තු	3,993,700	5,864,057	4,194,057	1,670,000	4,027,000	5,558,941	4,974,331	3,340,633
වෙනත් ආදායම්	8,186,000	13,589,747	12,209,384	1,380,363	7,331,000	11,279,314	11,060,858	2,507,983
එකතුව	**70,482,900**	**83,567,841**	**75,133,902**	**8,433,940**	**67,090,000**	**75,836,382**	**71,145,665**	**19,307,479**

2.2.2 ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය

විගණන නිරීක්ෂණ	**සභාවේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
සමාලෝචිත වර්ෂයේ ජනවාරි 01 දිනට හිඟ මුළු ආදායම රු.මිලියන 19.31 ක් වූ අතර, වර්ෂයේ බිල් කිරීම් රු.මිලියන 83.57 ක් විය. ඒ අනුව වර්ෂය තුළ රැස්කළ යුතු සමස්ථ ආදායම රු.මිලියන 102.88 ක් වුවද, රැස්කරන ලද ආදායම රු.මිලියන 75.13 ක් වූයෙන් ආදායම රැස්කිරීමේ ප්‍රගතිය සියයට 73 ක මට්ටමක පැවතුණි. සමස්තයක් ලෙස තත්ත්වය එලෙස පැවතුණද වරිපනම් හා බදු සම්බන්ධයෙන් මෙම ප්‍රතිශතය සියයට 56 ක් වැනි පහළ අගයක් වීය.	විගණන නිරීක්ෂණය පිළිගන්නා බව.	හිඟ ආදායම් රැස් කර ගැනීමේ ප්‍රගතිය වර්ධනය කරගත යුතු අතර, ආදායම් ඇස්තමේන්තුකරණය නිවැරදිව සිදුකළ යුතුය.

2.2.3 වරිපනම් හා බදු

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වරිපනම් ඒකක 5,661 කින් ලැබිය යුතු වරිපනම් රු.මිලියන 5.04 ක් මහා නගර සහා අඥා පනතේ 252 (1) වගන්තිය ප්‍රකාරව අය කරගෙන නොතිබුණි. තවද හිඟ ශේෂය තුළ වර්ෂ 03 ත් 05 ත් අතර සහ වර්ෂ 05 ට වැඩි ශේෂ එකතුව පිළිවෙලින් රු.457,237 ක් හා රු.248,879 ක් විය.	හිඟයෙන් රු.657,491 ක් අයකර ඇති අතර ඉතිරි හිඟය අයකර ගැනීමට කටයුතු කරන බව.	පනතේ 252 (1) වගන්තිය ප්‍රකාරව හිඟ ආදායම් කඩිනමින් අයකරගත යුතුය.
(ආ)	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ආයතන 28 කින් ලැබිය යුතු කසල බදු රු.559,010 ක් අයකර ගෙන නොතිබුණු අතර හිඟ ශේෂය තුළ 2020 සිට 2022 දක්වා වර්ෂයන්ට අදාළව හිඟ හිටි ශේෂය රු.97,250 ක් විය.	හිඟයෙන් 2025 වර්ෂයේ රු.348,202 ක් අයකරගෙන ඇති බවත්, 2020 සිට 2022 දක්වා හිඟ මුදල් අයකර ගැනීමේ ගැටළුවක් පවතින බව.	හිඟ ආදායම් කඩිනමින් අයකරගත යුතුය.
(ඇ)	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ව්‍යාපාර හා කර්මාන්ත ඒකක 82 කින් ලැබිය යුතු රු.206,000 ක ව්‍යාපාර හා කර්මාන්ත බදු අයකර ගැනීමට මහා නගර සභා ආඥා පනතේ 247 (ආ) 4 වගන්තිය පරිදි කටයුතු කර නොතිබුණි. තවද හිඟ ශේෂය තුළ 2022, 2021 හා ඊට පෙර වර්ෂයන්ට අදාළව හිඟ හිටි ශේෂය රු.153,000 ක් විය.	හිඟයෙන් 2025 වර්ෂයේ රු.20,000 ක් අය කරගෙන ඇති අතර ඉතිරිය අයකර ගැනීමට කටයුතු කරන බව.	පනතේ 247 (ආ) 4 වගන්තිය ප්‍රකාරව හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුය.

2.2.4 කුලී

විගණන නිරීක්ෂණ	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සභාව සතු කඩකාමර හා ගොඩනැගිලි බදුදීම වෙනුවෙන් ඒකක 59 කින් ලැබිය යුතු කුලී රු.මිලියන 2.56 ක් මහා නගර සභා ආඥා පනතේ 253 (1) වගන්තිය ප්‍රකාරව අයකරගෙන නොතිබුණු අතර හිඟය තුළ වර්ෂ 03 ඉක්මවූ ශේෂය රු.266,708 ක් විය.	හිඟයෙන් 2025 වර්ෂයේ කඩ කාමර කුලියෙන් රු. මිලියන 1.71 ක් අයකර ගෙන ඇති බව සහ කුලී නොගෙවීම නිසා කඩ කාමර මුද්‍රා තැබීමට කටයුතු කර ඇති බවත් තවත් හිඟ මුදලක් කපා හැරීමට සහ නඩු පැවරීමට කටයුතු කර ඇති බව.	පනතේ 253 (1) වගන්තිය ප්‍රකාරව හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුය.

2.2.5 බලපත්‍ර ගාස්තු

	විගණන නිරීක්ෂණ	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ව්‍යාපාර ඒකක 129 කින් ලැබිය යුතු රු.326,000 ක වෙළඳ බලපත්‍ර ගාස්තු මහා නගර සභා ආඥා පනතේ 247 (ආ) 4 වගන්තිය ප්‍රකාරව අය කරගෙන නොතිබුණි. හිඟ ශේෂය තුළ වර්ෂයකට වඩා වැඩි කාලයක සිට හිඟ හිටි ශේෂය රු.246,000 ක් විය.	හිඟයෙන් 2025 වර්ෂයේ රු.22,500 ක් අයකර ගෙන ඇති අතර, ඉතිරිය අයකර ගැනීමට කටයුතු කරන බව.	පනතේ 247 (ආ) 4 වගන්තිය ප්‍රකාරව හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුය.
(ආ)	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු දැන්වීම් පුවරු ගාස්තු රු.මිලියන 4.21 ක් අයකර ගෙන නොතිබුණු අතර ඉන් ඉකුත් වර්ෂයන්ට අදාළව ලැබිය යුතු ශේෂය රු.මිලියන 2.73 ක් විය.	හිඟයෙන් 2025 වර්ෂයේ රු.310,610 ක් අයකර ගෙන ඇති අතර, ඉතිරිය අයකර ගැනීමට නඩු පවරා ඇති බව.	හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුය.
(ඇ)	2022 ජනවාරි 27 දිනැති අංක 2264/18 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ පල කරන ලද 1980 අංක 47 දරණ ජාතික පාරිසරික පනතට අදාළව I ඡේදයේ (ඇ) කොටසට අයත්වන කර්මාන්ත සඳහා පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබාගත යුතු වුවත්, එසේ බලපත්‍රය අලුත් නොකරන ලද ආයතන 16 ක් පැවතීමෙන් රු.104,400 ක ආදායමක් සභාවට අහිමි වී තිබුණි. ඒ අනුව බල ප්‍රදේශයේ ක්‍රියාත්මක වන එම ව්‍යාපාර මගින් පරිසරයට වන හානිය පිළිබඳව නියාමනයක් සිදුකර නොමැති බව නිරීක්ෂණය විය.	ක්ෂේත්‍ර පරීක්ෂණ සිදුකර අදාළ ක්‍රියාමාර්ග ගෙන ඇති බව.	පනතට අනුකූලව කර්මාන්ත සඳහා පරිසර ආරක්ෂණ බලපත්‍ර අලුත් කළ යුතු අතර ඒ වෙනුවෙන් ආදායම් අයකර ගත යුතුය.

2.2.6 වෙනත් ආදායම්

විගණන නිරීක්ෂණ	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු වරෙන්තු ගාස්තු, දඩපොලී හා සේවා සඳහා ගාස්තු පිළිවෙලින් රු.840,277 ක්, රු.906,193 ක් හා රු.296,824 ක් අයකර ගෙන නොතිබුණි.	වරෙන්තු ගාස්තු හිඟයෙන් රු.120,852 ක් ද, වාර්ෂික ටෙන්ඩර් බදු දීමෙන් රු.33,041 ක් ද, සේවා සඳහා ගාස්තු හිඟයෙන් රු.268,438 ක් අයකර ගෙන ඇති බව සහ ඉතිරි හිඟ අයකර ගැනීමටත් තවත් ශේෂ කපා හැරීමට සහ නඩු පැවරීමටත් කටයුතු කර ඇති බව.	හිඟ ගාස්තු කඩිනමින් අයකර ගත යුතුය.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්යසාධනය

මහා නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

	විගණන නිරීක්ෂණ	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂයේ, වාර්ෂික අයවැය ලේඛනය මඟින් ප්‍රතිපාදනය කර තිබුණු එකතු වටිනාකම රු.මිලියන 70 ක් වූ කාණු පද්ධති, බෝක්කු සහ මාර්ග සංවර්ධන කටයුතු මෙන්ම සභා දේපල සංවර්ධන යෝජනා 14 ක් සමාලෝචිත වර්ෂය තුළදී ක්‍රියාත්මක කර නොතිබුණි.	ප්‍රමාණවත් ප්‍රතිපාදන ලැබුණු පසු ඉදිරියේදී මෙම සංවර්ධන කටයුතු සිදුකරන බව.	අයවැය මඟින් ප්‍රතිපාදන කර ඇති සංවර්ධන යෝජනා ක්‍රියාත්මක කළ යුතුය.
(ආ)	2000 අංක 53 හා 1988 අංක 56 දරණ පනත් මඟින් සංශෝධිත 1980 අංක 47 දරණ ජාතික පරිසර පනත යටතේ ප්‍රකාශිත 2264/17 හා 2022 ජනවාරි 27 දිනැති අතිවිශේෂ ගැසට් නිවේදනය අනුව මහා නගර සභාවේ ඝණ අපද්‍රව්‍ය මධ්‍යස්ථානය සඳහා ලබාගත් පාරිසරික ආරක්ෂණ බලපත්‍රය අලුත් කරගැනීමට කටයුතු කර නොතිබුණි.	කසළ කන්ද නිසියාකාරව සකස් කළද , පස් ලබා ගැනීමට නොහැකි වූ බැවින් පාරිසරික ආරක්ෂණ බලපත්‍රය ලබාගැනීමට නොහැකි වූ බව.	යොමුගත පනත හා ගැසට් නිවේදනය අනුව පාරිසරික ආරක්ෂණ බලපත්‍ර ලබා ගැනීමට කටයුතු කළ යුතුය.
(ඇ)	මධ්‍යම පරිසර අධිකාරියේ හම්බන්තොට දිස්ත්‍රික් කාර්යාලයේ සහකාර අධ්‍යක්ෂගේ අංක CEA/SU/ HM/MHB/SZ/C36/2912 /2021 හා 2023 නොවැම්බර් 07 දිනැති ලිපිය මඟින්ද ඔවුන් සිදුකළ ක්ෂේත්‍ර පරීක්ෂාවේදීද, මළ අපද්‍රව්‍ය පිරිපහදු පද්ධතිය කාර්යක්ෂමව ක්‍රියාත්මක නොවන බවත්, එම පද්ධතිය කාර්යක්ෂමව ක්‍රියාත්මක වන පරිදි වැඩිදියුණු කළ යුතු බවත්, මළ අපද්‍රව්‍ය පිරිපහදු පද්ධතිය සඳහා පාරිසරික ආරක්ෂණ බලපත්‍රය ලබාගත යුතු බවත් දක්වා තිබුණද, 2024 දෙසැම්බර් 31 දින වන විටත් එම කටයුතු සම්පූර්ණ කර නොතිබුණි.	පාරිසරික ආරක්ෂණ බලපත්‍රය ලබා ගැනීමට අදාළ අයදුම්පත් හා එහි ක්‍රියාවලිය දන්වා එවන මෙන් ඉල්ලීම් කළද මෙතෙක් ලිඛිතව දන්වා නොමැති බව.	මළ අපද්‍රව්‍ය පිරිපහදු පද්ධතිය සඳහා පාරිසරික ආරක්ෂණ බලපත්‍ර ලබාගත යුතුය.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණ	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	1958 අංක 15 දරණ සේවක අර්ථසාධක අරමුදල් පනත අනුව මූලික වැටුප්, ජීවන වියදම්, විශේෂ දීමනා සහ වෙනත් සමාන දීමනා වැනි දෑ එකතු කර, මුළු මාසික ඉපැයීම් වලින් අවම වශයෙන් සේවකයාගෙන් සියයට 8 ක් හා සේවා යෝජකයාගෙන් සියයට 12 ක් වශයෙන් දායක මුදල් ගෙවිය යුතු වුවද, මහා නගර සභාව විසින් ආදේශක සේවකයින් සඳහා මූලික වැටුප් පමණක් පදනම් කර ගනිමින් දායක මුදල් ගෙවා තිබුණි.	ආයතන සංග්‍රහයේ සහ 24/2018 චක්‍රලේඛය පරිදි ගණනය කිරීම සිදුකළ බව.	පනත අනුව දායක මුදල් අයකිරීමට කටයුතු කළ යුතුය.
(ආ)	සභාවේ සේවයේ නියුතු ආදේශක/කොන්ත්‍රාත් සේවකයින් සඳහා සේවක අර්ථසාධක අරමුදලට දායක මුදල් 2022 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා එකතුව රු.මිලියන 1.13 ක් අර්ථසාධක අරමුදලට නොගෙවා සභාවේ පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි.	සියලුම සාමාජික අංක ලබාගත් පසු පොදු තැන්පත් ගිණුමේ රඳවා ඇති දායක මුදල් ගෙවීමට කටයුතු කරන බව.	අයකරනු ලබන දායක මුදල් සේවක අර්ථසාධක අරමුදලට ප්‍රමාදයකින් තොරව ගෙවිය යුතුය.
(ඇ)	1980 අංක 46 දරණ සේවා නියුක්තිභාර අරමුදල් පනත ප්‍රකාරව 2014 අප්‍රේල් සිට 2022 දෙසැම්බර් දක්වා කාලපරිච්ඡේදයට සේවකයින්ගේ දායක මුදල් නියමිත පරිදි නොගෙවීම නිසා අධිභාර වශයෙන් රු.425,560 ක මුදලක් ගෙවා තිබූ අතර එයට හේතුවූ කරුණු සොයා බලා වගකිවයුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.	සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය සමඟ සාකච්ඡා කර වාර්තාවක් ඉදිරිපත් කරන බව.	අධිභාර ගෙවීමට හේතු වූ කරුණු සොයා බලා අදාල වගකිවයුතු පාර්ශවයන්ගෙන් අයකර ගත යුතුය.
(ඈ)	කඩ කාමර හතරකට අදාළව තැන්පත් කර වසර 5 ක් ඉක්මවා තිබුණු එක්වන් මුදල් රු.මිලියන 1.34 ක් ආදායමට බැර කර නොතිබුණි.	එක්වන් මුදල් සහා ආදායමට ගැනීමට කටයුතු කරන බව.	එක්වන් මුදල් සභා ආදායමට ගැනීමට කටයුතු කළ යුතුය.

3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

විගණන නිරීක්ෂණ	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
2017 වර්ෂයේ දේපල තක්සේරු කිරීම් කටයුතු ආරම්භ කර තිබුණු කොට්ඨාස අංක 13 හි පිහිටි හම්බන්තොට වරාය පිහිටි විශේෂ දේපල තක්සේරු කිරීම් කටයුතු සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් නිම කර නොතිබුණු අතර ඒ සඳහා වසර 07 ක කාල ප්‍රමාදයක් සිදුව තිබුණි. 2025 අප්‍රේල් 08 දිනැති රජයේ තක්සේරු වාර්තා අනුව 2017 වර්ෂයට අදාලව දේපලෙහි වාර්ෂික වටිනාකම රු.මිලියන 2,030.77 ක් වූයෙන් වාර්ෂික වරිපනම් බදු ආදායම රු.මිලියන 142.15 ක් විය යුතුව තිබුණි. එය මහා නගර සභාවේ සමස්ථ පුනරාවර්තන ආදායමට ආසන්න අගයකින් යුතු ආදායම් ප්‍රභවයක් වී තිබුණි.	2020 සිට 2025 පළමු කාර්තුවේ වරිපනම් අයකිරීමට නිසි පරිදි තක්සේරු වාර්තා නොලැබුණු බව සහ 2025 මාර්තු 08 දිනැති තක්සේරු වාර්තාව අනුව 2025 දෙවන තෙවන හා සිව්වන කාර්තු සඳහා බදු ගෙවන ලෙස දන්වා ලිපි යොමුකර ඇති බව.	විශේෂ දේපල සම්බන්ධයෙන් තක්සේරුව කාලානුරූපීව සිදුකර වරිපනම් බදු අයකර ගත යුතුය.

3.4 වත්කම් කළමනාකරණය

	විගණන නිරීක්ෂණ	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2013 සිට 2021 වර්ෂයේ අප්‍රේල් දක්වා නාගරික සංවර්ධන අධිකාරිය විසින් මහා නගර සභාව වෙත ලබාදී තිබූ නිල නිවාස දෙක සඳහා ජලය සැපයීම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රධාන ජල සැපයුම හරහා සිදුකර තිබුණු අතර එම කාලවලට අදාළ නගරාධිපති නිල නිවසේ රු.311,462 ක් හා නාගරික කොමසාරිස් නිල නිවසේ රු.163,618 ක් වශයෙන් එකතුව රු.475,080 ක හිඟ ජල ගාස්තුවක් පැවතියද, නිල නිවාස භාවිතා කළ පාර්ශවයන්ගෙන් එම මුදල් අයකර පියවීම් කිරීමට සභාව කටයුතු කර නොතිබුණි.	නිවාස භාවිතා කළ පාර්ශවයන්ට ලිපි මඟින් දන්වා ඇති බව සහ නාගරික කොමසාරිස් නිල නිවසෙන් රු.16,298 ක් අයවී ඇති බව.	හිඟ ජල බිල්පත් නිල නිවාස භාවිතා කළ පාර්ශවයන්ගෙන් අයකර පියවීමට කටයුතු කළ යුතුය.
(ආ)	අංක හපපා/සී/06/13/ඉඩම්/සං/ අත්.පොදු හා 2019 නොවැම්බර් 22 දිනැති දකුණු පළාත් පාලන කොමසාරිස් අමතන ලද හම්බන්තොට පළාත් පාලන සහකාර කොමසාරිස්ගේ ලිපියෙන් අක්කර 30 ක් වූ කොම්පෝස්ට් ව්‍යාපෘතිය සඳහා වෙන් කරනු ලැබූ ඉඩම (රුහුණු ෆාම් අසළ) නිරවුල් කර ගැනීමට අවශ්‍ය තොරතුරු යවා තිබුණද, ඉන්පසු ඉඩම පවරා ගැනීමට අදාළ කටයුතු මෙතෙක් නිම වී නොතිබුණි.	අදාළ ඉඩම පවරා දෙන ලෙස ලිපි මඟින් ඉල්ලීම් කර ඇති බව.	ඉඩම පවරා ගැනීමට අදාළ කටයුතු සිදුකළ යුතුය.
(ඇ)	2023 වර්ෂයේ ස්ථාවර වත්කම් සමීක්ෂණ වාර්තාව අනුව 2024 දෙසැම්බර් 31 දින වන විට සභාව විසින් පරිහරණය කරනු ලබන ඉඩම් 25 ක් සභාවට පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.	අදාළ ඉඩම් පවරා දෙන ලෙස ඉල්ලීම් කර ඇති බව.	සභාව සතු පරිහරණය කරනු ලබන ඉඩම් සභාව වෙත පවරා ගැනීමට කටයුතු කළ යුතුය.
(ඈ)	2017 වර්ෂයේදී පමණ ඝණ අපද්‍රව්‍ය මධ්‍යස්ථානය වෙත ලැබී තිබුණු ප්ලාස්ටික් කඩන සහ සේදුම් යන්ත්‍ර මඟින් අදාළ කාර්යයන් ඉටු නොකර නිෂ්කාර්යව ගොඩනැගිල්ල තුළ තබා තිබුණි.	ප්ලාස්ටික් වර්ගීකරණය සඳහා නියමිත දැනුම හා පුහුණුව සහිත සේවකයින් නොමැතිකම හා ඒ සඳහා වැයකරන ලද මුදලට සරිලන ආදායමක් නොලැබීම නිසා යන්ත්‍ර භාවිතයට නොගන්නා බව.	යන්ත්‍ර නිෂ්කාර්යව නොතබා ප්‍රයෝජනයට ගත යුතුය.

3.5 මානව සම්පත් කළමනාකරණය

විගණන නිරීක්ෂණ	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
2001 අගෝස්තු 22 දිනැති අංක 18/2001 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව වසර 05 ක් ඉක්මවන එකම සේවා ස්ථානයේ සේවය කර ඇති සෑම නිලධාරියෙකුම වෙනත් සේවා ස්ථානවල සේවය කිරීමට ඉඩදීම සඳහා ස්ථාන මාරු ලබාදිය යුතු වුවත්, සභාව තුළ සේවය කරනු ලබන නිලධාරින් 08 දෙනෙකු වසර 05 සිට වසර 10 දක්වා වූ කාලපරිච්ඡේදයක් එකම ස්ථානයේ සේවය කරමින් සිටිබව නිරීක්ෂණය විය.	විධිමත් පරිදි ස්ථානමාරු ප්‍රතිපත්තිය ක්‍රියාත්මක නොවීම මෙයට හේතු වූ බවත් වසර 05 ඉක්මවූ නිලධාරීන් මෙවරද වාර්ෂික ස්ථානමාරු ඉල්ලීම් කර ඇති බව.	එකම සේවා ස්ථානයේ වසර 05 ක සේවා කාලය ඉක්මවූ නිලධාරීන් සම්බන්ධයෙන් යොමුගත චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය.

3.6 වාහන උපයෝජනය

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව ඉන්ධන දහන පරීක්ෂාව සිදුකළ යුතු වුවද, සභාව සතුව පවතින වාහන අතුරින් වාහන 02 ක එම කටයුත්ත සිදුකර නොතිබුණි.	ඉන්ධන දහන පරීක්ෂාව කඩිනමින් සිදුකර විගණනය වෙත ඉදිරිපත් කරන බව.	යොමුගත චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව ඉන්ධන දහන පරීක්ෂාව සිදුකළ යුතුය.
(ආ)	සභාවේ එදිනෙදා කාර්යයන් සඳහා අවශ්‍ය සභාව සතු වාහන 03 ක් අළුත්වැඩියාකර භාවිතයට ගැනීමට කටයුතු කර නොතිබුණු අතර වාහන 04 ක අයිතිය පවරා ගැනීමටද කටයුතු කර නොතිබුණි.	එක් වාහනයක් අලුත්වැඩියාව සඳහා අනුමැතිය ඉල්ලා ඇති බවත්, ඉතිරි වාහන දෙකෙහි අලුත්වැඩියා කටයුතු සිදු කරනු ලබන බවත්, වාහන 03 ක් පවරා ගැනීමට අදාළ කටයුතු සිදුකරමින් පවතින බව සහ එක් වාහනයක් අපහරණය කිරීමට අනුමැතිය ඉල්ලා ඇති බව.	එදිනෙදා කාර්යයන් සඳහා අවශ්‍ය වාහන අළුත්වැඩියා කිරීමට සහ පවරා ගැනීමට කටයුතු කළ යුතුය.

4. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය

4.1 අයවැය පාලනය

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	වෙනත් ආදායම්, ආදායම් ආධාර සහ ප්‍රාග්ධන ලැබීම් විෂයයන් තුනෙහි අහිතකර විචලනය රු.මිලියන 100.08 ක් වූ අතර එහි විචලනය සියයට 23 ත් 98 ත් අතර විය.	විචලනයන් අවම කර ගැනීමට කටයුතු කර ගන්නා බව.	විචලනයන් අවම කිරීමත්, සැලසුම්කරණය විධිමත් කර ගැනීමත්, ආදායම් රැස්කිරීම කාර්යක්ෂම කර ගැනීමත් සිදු කළ යුතුය.
(ආ)	ආධාර මුදල් වැය විෂයයේ අහිතකර විචලනය රු.432,846 ක් වූ අතර එහි විචලනය සියයට 156 ක් විය.	විචලනයන් අවම කර ගැනීමට කටයුතු කර ගන්නා බව.	විචලනයන් අවම කර ගත යුතු අතර ඒ සඳහා සැලසුම්කරණය විධිමත් කරගත යුතුය.

4.2 පාරිසරික ගැටළු

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	කොම්පෝස්ට් නිෂ්පාදනය සඳහා ගෙන එන නාගරික ඝණ අපද්‍රව්‍ය කුණු කන්දක් ආකාරයට වන රක්ෂිතය ආසන්නයේ විශාල බිම් ප්‍රමාණයක විවෘතව ගොඩගසා පැවතීමෙන් එහි විශාල වශයෙන් ගැවසෙන සුනඛයින් හා පක්ෂීන් විසින්ද පොලිතින් සහිත ආහාර කොටස් ඇද දමමින් පැවතුණි.	පස් ලබා ගැනීම සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් අවසර ලබා ගැනීමට අපහසු වීම සහ ප්‍රමාණවත්ව අදාළ අවසරය නොලැබීම මත එම කාර්යය නිසියාකාරව සිදුකිරීම නොහැකි වූ බව.	විවෘත භූමියේ ගොඩගසා නොතබා ඝන අපද්‍රව්‍ය නිසි ලෙස කළමනාකරණය කළ යුතුය.
(ආ)	ප්‍රතිචක්‍රීකරණය කළ නොහැකි ද්‍රව්‍ය වෙන්කර ඒවා පමණක් සනීපාරක්ෂක කසළ රඳවනය වෙත යොමු කිරීමට පියවර ගතයුතු වුවද, පොළ භූමියේ ඉවත් කරන දිරන කසළ ද විවෘත භූමියේ ගොඩගසා බිම් පිරවීම සඳහා යොදාගෙන තිබුණි. එසේම ඉලෙක්ට්‍රොනික් අපද්‍රව්‍ය හා බහාලුම්වල ගබඩා කර ඇති විදුලි බල්බ (CFL, ටියුබ් ලයිට්) බැහැර කිරීම සම්බන්ධවද විධිමත් වැඩපිළිවෙලක් සකස් කර නොතිබුණි.	නොදිරන කසළ සනීපාරක්ෂක කසළ රඳවනය වෙත යොමු කරනු ලබන බව සහ විද්‍යුත් අපද්‍රව්‍ය ඒකරාශී කර බැහැර කිරීමට නිසි ක්‍රමයක් මේ වන තෙක් ලබාදී නොමැති බව.	ප්‍රතිචක්‍රීකරණය කළ නොහැකි ද්‍රව්‍ය බැහැර කිරීමේ ක්‍රමවේදයන් විධිමත් කළ යුතුය.

(ඇ)	252 අධිකාරිය වන මහා නගර සභා ආඥා පනතේ 129 ප්‍රකාරව මළ අපද්‍රව්‍ය පිරිපහදු පද්ධතිය කාර්යක්ෂමව පවත්වා ගත යුතු වුවද, ජලය පිරිපහදු කිරීමේ ක්‍රියාවලිය මීට වසර 05 කට වැඩි කාලයක සිට සිදු නොවන බවත්, එහි ඇති ජල පෙරනයද අකර්මන්‍යව පැවති බවත් නිරීක්ෂණය විය. තවද පිරිපහදු නොවී බැහැර කරන එම ජලය ආසන්න වලකට මුදාහැර ඒ හරහා වැසි දින වලදී වන රක්ෂිතයට ගලායමින් පැවතුණි.	ජල පොකුණේ වගා කටයුතු සඳහා ජලය ලබාගන්නා බවත් වැසි කාලයට පොකුණෙන් ජලය පිටතට ගලා යන බව.	මළ අපද්‍රව්‍ය පිරිපහදු පද්ධතිය විධිමත්ව පවත්වා ගත යුතුය.
(ඈ)	කොම්පෝස්ට් ව්‍යාපෘතිය සඳහා වෙන්කර ඇති අක්කර 30 ක භූමි ප්‍රමාණයෙන් පුද්ගලික සමාගමක් වෙත ලබාදී ඇති පර්චස් 40 ක ඉඩමේ ස්ථාපිත ඉන්සිනරේටර් යන්ත්‍ර මඟින් රසායනික අපද්‍රව්‍ය දහනය කිරීමේ ව්‍යාපෘතිය හරහා පරිසරයට සිදුවන බලපෑම පිළිබඳව ශක්‍යතා අධ්‍යයනයක් කළ බව සනාථ කර ගැනීම සඳහා තොරතුරු සභාව සතුව නොතිබුණි.	විගණන නිරීක්ෂණ පිළිගන්නා බව.	පරිසරයට සිදුවන බලපෑම පිළිබඳව ශක්‍යතා අධ්‍යයනයක් කළ යුතුය.

4.3 තිරසාර සංවර්ධන අරමුණු

විගණන නිරීක්ෂණය	**සභාවේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
මහා නගර සභාව විසින් තිරසර සංවර්ධන අරමුණු 09 ක් හඳුනාගෙන තිබුණු අතර ඉන් බල ප්‍රදේශයේ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම හැර අරමුණු දෙකකට අදාළව ක්‍රියාකාරකම් තුනක් ඉටුකර නොතිබුණි. තවද, අරමුණු 03 කට අදාළව ක්‍රියාකාරකම් හතරක භෞතික ප්‍රගතිය සියයට 0-49 අතර අවම ප්‍රතිශතයක පැවතුණි.	නිරීක්ෂණය පිළිගන්නා බව සහ විවිධ කරුණු හේතුවෙන් ක්‍රියාකාරම් ඉටුකර ගැනීමට නොහැකි වූ බව.	ආයතනයේ පිහිටුවා ඇති තිරසර සංවර්ධන අරමුණු කරා නියමිත කාලය තුළ ළඟා වීමට කටයුතු කළ යුතුය.